සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/02/01
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2017/04/07

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- ස.ප්‍ර.බැ.2017/05

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන්,

## සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකයින්ට එල්.පී.ගෑස් (L.P.Gas) පහසුකම ලබා ගැනීමට ණය පහසුකම් ලබාදීම.

### 01. හැඳින්වීම.

සමෘද්ධි ප්‍රජාමූල ක්ෂුද්‍ර මූල්‍යකරණ බැංකු ජාලය හා එකතු වී ඇති සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ට එල්.පී.ගෑස් පහසුකම ලබා ගැනීමට අවශ්‍ය ගෑස් සිලින්ඩරයක් ඇතුළු උපාංග සහන මිලකට ලබාදීමට සී/ස ලාෆ්ස් සමාගම යෝජනා කර, ඉල්ලීම් කර ඇත.

ඒ අනුව මෙම වැඩසටහන දියත් කිරීම තුලින් පහත අරමුණු ලගා කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි.

1. අඩු ආදායම්ලාභීන් වන බැංකු සාමාජිකයින්ගේ, දෛනික කටයුතු සරල කිරීම.
2. ආපනශාලා, රසකැවිලි නිෂ්පාදනය ඇතුළු බොහෝ ආදායම් උත්පාදන කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ නංවා ආදායම ඉහළ නැංවීම.
3. බැංකු ණය ප්‍රමාණය ඉහළ නැංවීම තුලින් බැංකු තිරසාර කිරීම.
4. පාරිසරික සුරක්ෂිතතාවය ඇති කිරීම.

මෙම එල්.පී.ගෑස් පහසුකම ලබාදීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන යටතේ ණය මුදලක් ලබාදීම ඇතුළු වැඩසටහන දියත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කෙරේ.

### 02. ලබාදෙන උපාංග පිළිබඳ විස්තරය

එල්.පී.ගෑස් සිලින්ඩරය ඇතුළු ලබාදෙන උපාංග හා මිල ගණන්වල විස්තරය ඇමුණුම් 01 මගින් දක්වා ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4th floor, Sethsiripaya ,Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2873802/2872202
Fax - 011-2889002
E-mail- dg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk
Hot Line : 0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
Hot Line: 011- 2887722

## 03. උපරිම ණය මුදල, ණය පිළිබඳ තොරතුරු

03.1. උපරිම රු.10,000 ණය මුදලක් ලබාදිය හැකි අතර, ණය ඉල්ලුම්කරුගේ ඉල්ලීම හා අවශ්‍යතාවය පරිදි එක් ණය මුදලක් පමණක් ලබාදිය යුතුය.

03.2. මෙම වැඩසටහන සඳහා, නව යෝජනා ක්‍රමයක් දියත් නොකරන අතර දැනට ක්‍රියාත්මක පහත ණය වැඩසටහන් යටතේ ණය ලබාදිය හැක.

1. පාරිභෝගික ණය - දැනටමත් සමූහ ණය සංරක්ෂණ වැඩසටහනට දායක වී ඇති සුදුසුකම් සහිත සාමාජිකයින්ට
2. ආපදා ණය - බැංකු සාමාජිකත්වය හිමි හා සුදුසුකම් සපුරා තිබීම.
3. හදිසි ව්‍යාපෘති ණය - ආදායම් උත්පාදන කාර්යයකට මෙම පහසුකම භාවිතා කරන අවස්ථාවකදී
4. ජීවනෝපාය සංවර්ධන ණය - බැංකු සාමාජිකත්වය හිමි, ආදායම් උත්පාදන කාර්යයක නිරත ඒ සඳහා සහාය කර ගැනීමට අපේක්ෂිත සාමාජිකයින්

03.3. ණය මුදල් ඉල්ලුම් කිරීමේ සිට අනුමත කිරීම ඇතුළු සියළුම උපදෙස් දැනට ණය සම්බන්ධ නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් පරිදි සිදුවිය යුතුය.

03.4. බැංකුව හරහා පමණක්, සාමාජිකයන්ට ණය පහසුකම් නොමැතිව එකවර මුදල් ගෙවා වුවද මෙම පහසුකම ලබා ගැනීමට ඉඩදෙනු ලැබේ.

## 04. ගෑස් පහසුකම ඉල්ලුම් කිරීම හා උපකරණ කට්ටලය ලබාදීම.

04.1. ලී/ස ලාෆ්ස් ගෑස් සමාගමේ නිලධාරීන් විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හරහා අඩු ආදායම්ලාභීන් දැනුවත් කිරීම සිදු කරයි. ඒ සඳහා රැස්වීම් සංවිධානය කිරීම සම්බන්ධීකරණය වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සිදු කල යුතුය.

04.2. ප්‍රතිලාභින් දැනුවත් කිරීමෙන් අනතුරුව, ප්‍රතිලාභින් විසින් ස්ව කැමැත්ත මත අදාල ගෑස් පහසුකම ලබා ගැනීමට තීරණය කල පසු, සමෘද්ධි ප්‍රජාමූල බැංකුවෙන් ණය පහසුකම ඉල්ලුම් කිරීම හා කැමැත්ත ලිඛිතව ලබා දීම සිදුකල යුතුය.

04.3. සමාජිකයන් ප්‍රජාමූල බැංකු හරහා ගෑස් කට්ටලය ලබා ගැනීමට කැමැත්ත පල කළ විට, පහත පරිදි තොරතුරු රැස්කර, සකස් කර ලි/ස ලාෆ්ස් සමාගම වෙත විද්‍යුත් හා තැපැල් මාර්ගයෙන් යොමු කළ යුතුය.

01. ඉල්ලුම්කරුගේ නම
02. සමාජික අංකය
03. ඉල්ලුම් කරන ගෑස් කට්ටලය (12.5 kg/5.kg යන වග)
04. ලිපිනය
05. දුරකථන අංකය
06. ප්‍රජාමූල සංවිධානයේ නම

විද්‍යුත් ලිපිනය :- sales.mt@laugfs.lk

තැපැල් ලිපිනය :- ඒඩ්‍රියන් සමරසේකර

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - නව්‍ය විකුණුම්

ලාෆ්ස් ගෑස් පි.එල්.සි

නො.101

මායා ඇවනිවු

කොළඹ - 06

04.4. වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින්, සාමාජිකයින් විසින් කරන ණය ඉල්ලීම් සඳහා සහාය ලබාදිය යුතු අතර, සම්පූර්ණ කරන ලද ණය ඉල්ලුම් පත්‍ර බැංකුව වෙත ලබාදීම සිදුකල යුතුය.ප්‍රජාමූල බැංකු විසින් නිසි පරීක්ෂාවෙන් අනතුරුව, නිර්දේශ සහිත පාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය.

04.5. ණය මුදල් ඉල්ලුම් කිරීමේදී, ණය මුදල අනුමත කිරීමෙන් අනතුරුව සී/ස ලාෆ්ස් සමාගම වෙතින් මිලදීගත් ගෑස් උපාංග කට්ටලය වෙනුවෙන් මුදල් ප්‍රේෂණ කිරීම සඳහා සාමාජික ගිණුමෙන් අඩුකර, අදාල සමාගමට ලබාදීමට සාමාජිකයාගේ කැමැත්ත ලිඛිතව ලබාගත යුතුය.එම ලිඛිත කැමැත්ත නොමැතිව කිසිදු අවස්ථාවක ,මෙම වැඩසටහන යටතේ පහසුකම් නොලබයි.

04.6. ණය මුදල අනුමත වූ පසු කළමණාකරු විසින්, ණය ඉල්ලුම්කරු වෙත ණය මුදල අනුමත කල බවට ලිඛිතව දැනුම් දිය යුතුය. එහි පිටපත් සී/ස ලාෆ්ස් සමාගම වෙත ලබාදීම සිදු කල යුතුය.

04.7. ණය මුදල අනුමත වූ බවට සහතිකය ලද පසුව සී/ස ලාෆ්ස් ගෑස් සමාගම අදාල ගෑස් සිලින්ඩරය ඇතුළු උපාංග කට්ටලය ඉල්ලුම්කරුට (සාමාජිකයා) භාරදීමට කටයුතු කරනු ලබයි.

04.8. ඉල්ලුම්කරු ( සාමාජිකයා) අදාල ගෑස් සිලින්ඩරය හා ඇතුළු උපාංග කට්ටලය භාරගත් බවට සමාජිකයාගේ අත්සන සහිත භාණ්ඩ ලැබීම් පත්‍රිකාවේ පිටපතක් බැංකු කළමණාකරු වෙත භාරදිය යුතුය. (සී/ස ලාෆ්ස් ගෑස් සමාගම විසින්)

04.9. සී/ස ලාෆ්ස් සහ සමාගම විසින් අදාල ගෑස් උපාංග කට්ටලය භාර දී අදාල සමාගම විසින් ඉන්වොයිසියක් බැංකුව වෙත ලබාදෙනු ලැබේ. ඉන් අනතුරුව, එම ඉන්වොයිසිය හා භාණ්ඩ ලැබීම් විස්තරය තොරතුරු අනුව , ඇමුණුම් 01 හි සඳහන් මුදල චෙක්පතකින් සි/ ස ලාෆ්ස් සහ සමාගම වෙත පහත පරිදි ගිණුම් ගතකර ලබා දීමට පියවර ගත යුතුය.

## 05. සාමාජිකයා වෙනුවෙන් සී/ස ලාෆ්ස් ගෑස් සමාගමට මුදල් ලබාදීම හා බැංකුවෙහි කොමිස් මුදල් අයකර ගැනීම.

05.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් පහත පරිදි, සමාගම වෙත මුදල් යැවීම හා කොමිස් මුදල ගිණුම්ගත කල යුතුය. (සාමාජිකයාගේ ඉල්ලීම මත)

| | | |
|---|---|---|
| හර | - | සාමාජික තැන්පත් ගිණුම (සාමාජිකයාගෙන් අයකරන මුදල) |
| බැර | - | ලද ආදායම් මිශ්‍ර ගිණුම (බැංකුවට හිමි කොමිස් මුදල) |
| බැර | - | ජංගම ගිණුම (සාමාජිකයා ගෙවිය යුතු මුදලින්, කොමිස් මුදල අඩුකල පසු ඉතිරි මුදල) |

05.2. කොමිස් මුදල ගණනය කිරීම ඒ ඒ ගෑස් සිලින්ඩර ධාරිතාව අනුව, බැංකුවට හිමි කොමිස් මුදල ගණනය කල යුතුය. ඉන් අනතුරුව සී/ස ලාෆ්ස් සමාගමට යැවිය යුතු මුළු මුදලින්, බැංකුවට හිමි කොමිස් මුදල අඩුකර ඉතිරි මුදලට සමාන මුදල් වටිනාකමට පහත පරිදි චෙක්පතක් ලිවිය යුතුය.

05.3. චෙක්පත ලිපිය යුත්තේ, කළමණාකරු කොමර්ෂල් බැංකුව කොළඹ-04 හි ලාෆ්ස් ගෑස් පී.එල්.සී.ගිණුම් අංක 1680007115 ගිණුමට බැර වන පරිදි චෙක්පත රේඛනය කර, ලාෆ්ස් ගෑස් පී.එල්.සී.අංක 101, මායා ඇවනිව්, කොළඹ - 06ට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.මුදල් ප්‍රේෂණය,උපාංග කට්ටලය සඳහා ඉන්වොයිසිය හා භාණ්ඩ ලැබීම් පත්‍රිකාව බැංකුවට ලැබී දින 45 නොඉක්මන කාලයක් ඇතුලත එවිය යුතුය.

05.4. මෙම වැඩසටහන යටතේ ඇමුණුම් - 02 පරිදි, තොරතුරු ඇතුලත් රෙජිස්තරයක් බැංකුව නඩත්තු කළ යුතුය.

**06.** **පොදු කරුණු**

06.1. මෙම වැඩසටහන2017.03.16 සිට2019.03.15 දක්වා පමණක් ක්‍රියාත්මක වේ.ඉන් අනතුරුව මෙම වැඩසටහන අහෝසි වන අතර,තවද මෙම කාලය අවසන් වීමටපෙර,වැඩසටහන අත්හිටුවීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තීරණය කල හොත්,ඒ බව දැනුම් දීම සිදු කරනු ලබයි. එදින සිට වැඩසටහන අවසන් කල යුතුය.

06.2. මෙම උපදෙස් සඳහන් චක්‍රලේඛ, පළමුව පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර,වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාගත යුතුය.

06.3. මෙම වැඩසටහන යටතේ, ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම පිළිබඳ, වසම භාර නිලධාරි මෙන්ම කළමණාකරු විසින් සාමාජිකයින්ට මඟපෙන්වීම කල යුතුය.

06.4. අදාල සාමාජිකයා විසින්, තම ස්ව කැමැත්ත මත අදාල පහසුකම සඳහා ඉල්ලුම් කල යුතු අතර, ඒ සඳහා තොරතුරු සැපයීම පමණක් අප විසින් සිදු කල යුතුය.

06.5. ඉදිරියේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහන සහිතව ගෑස් සිලින්ඩරය ඇතුළු උපාංග කට්ටලය ලබාදීමට කඩිනමින් දැනුවත් කරන බවද තවදුරටත් දන්වමි.

06.6. මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගැනීම සඳහා සී/ස ලාෆ්ස් සමාගමේ පහත නිලධාරීන් අමතා ලබා ගත හැක.

- ඒඩ්‍රියන් සමරසේකර (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - නව්‍ය විකුණුම්) -0773706277
- නලින්ද අත්තනායක (කළමනාකරු - නව්‍ය විකුණුම්) -0773139195

**කේ.කේ.එල්.චන්ද්‍රතිලක**
**අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)**
**අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට**

**පිටපත් :-** 01. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ස.
02. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.හා අ.ක.ස
03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.හා අ.ක.ස